*සැ. යු.-* මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.05.06 දින පළ වූ අංක 1,705 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,706 - 2011 මැයි මස 13 වැනි සිකුරාදා - 2011.05.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | 910 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සැ. යු.** — ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 අප්‍රේල් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත 2011 අප්‍රේල් මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මැයි මස 20 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### විමර්ශන නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

1.0 සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වූ විමර්ශන නිලධාරි තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරි තනතුරු සඳහා පත්කිරීමට තෝරා ගනු ඇත.

3.0 3.1 සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය මත පත්කරනු ලැබේ.

3.2 පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම නොපිරවීම පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

4.0 *තනතුරට හිමි වැටුප් පරිමාණය.-* MN-4 (2006(A) 6/2006/(IV) රු. 15,215 - 10 x 215-4 x 240 - 7 x 320 - 15 x 360 - රු. 25,965

5.0 *අධ්‍යාපන හා වෙනත් වෘත්තීය සුදුසුකම්.-* සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ :

1. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයට අවු : 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
4. දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවාවන්හි නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
5. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
6. සිංහල/දෙමළ භාෂාව/සාහිත්‍ය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් දෙකක් ඇතුළුව සම්මාන සාමාර්ථ 4 ක් සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී (එක්වර විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; හෝ
7. සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, යන විෂයයන් ද ඇතුළුව සම්මාන සාමාර්ථ 04ක් සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී (එක්වරකදී විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; හෝ
8. පළමු භාෂාව, ගණිතය හා තවත් විෂයයන් දෙකකට "ඒ" හෝ "බී" ශ්‍රේණියේ සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී (එක්වරකදී විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය.) ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය සමත්වීම; සහ

පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් ලබා තිබිය යුතුය :

(i) ගණකාධිකරණ විෂය සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජවේදී උපාධිය සමග රජයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා සේවයේ ගිණුම් හා කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 05 ක පළපුරුද්ද,

(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/රජයේ බහුතාක්ෂණික ආයතනයක වාණිජ විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු ඩිප්ලෝමාව/ගණකාධිකරණය පිළිබඳ සිව් අවුරුදු ඩිප්ලෝමාව සමග රජයේ/පළාත් රාජ්‍ය සේවයේ සංස්ථා සේවයේ ගිණුම් කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 05 ක පළපුරුද්ද තිබීම,

(iii) ඉහත (i) හා (ii) ඡේදවල දැක්වෙන විභාගවල මධ්‍ය පරීක්ෂණය/ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ මූලික පරීක්ෂණය/එංගලන්ත වරලත් ගණකාධිකරණ ආයතනයේ මූලික පරීක්ෂණය ලන්ඩන් පරිපාලන ගිණුම් ආයතනයේ අවසාන සහතිකය සමග රජයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා සේවයේ ගිණුම් හා කළමනාකරණ කටයුතු පිළිබඳව වසර 10 ක පළපුරුද්ද තිබීම.

6.0 *විභාග පරිපාටිය* :

1. සාමාන්‍ය බුද්ධිය - 100 යි පැය 01
2. පොත් තැබීම හා ගිණුම් ක්‍රම 100 යි පැය 03

*සාමාන්‍ය බුද්ධිය.-* වර්තමානයේ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ සමාජ, ආර්ථික දේශපාලන හා භූගෝලීය තත්වයන් පිළිබඳ දැනීම අපේක්ෂා කෙරේ.

*පොත් තැබීම හා ගිණුම් ක්‍රම.-* අවසාන ගිණුම් හා ඊට ඇතුළත් වන උපකාරක ගිණුම්වලට අදාල මූලික දැනුම හා ආයතනික මූල්‍ය තත්වයන් විශ්ලේෂණය කළ හැකි අනෙකුත් අංශ පිළිබඳ දැනුම හා පළාත් පාලන ආයතනවලට අදාල දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරනු ලැබේ.

6.1 මෙම විභාගය තරග විභාගයක් වුවද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) අපේක්ෂකයින් විසින් ලබාගත යුතුවේ. තරග විභාගය සඳහා වෙන්කර ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

7.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයැදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

8.0 *විභාග ගාස්තු.-* විභාග ගාස්තුව රු. 450 කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 2003-90-01 ට බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ.

9.0 *අයදුම්පත්‍ර.-* ඒ 4 (21 cm x 29 cm) (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි දෙපසම භාවිත කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු වන පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවට ද ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

10.0 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2011" යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

10.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2011.06.13 දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය,
රත්නපුර.

11.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

12.0 අපේක්ෂකයකුහට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

සුනේත්‍රා ගුණවර්ධන,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

2011 අප්‍රේල් මස 21 වැනි දින,
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ විමර්ශන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2011**

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4
(කොටුව තුළ අදාළ අංකය ලියන්න) ☐

1.0 1.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. : perera, A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - 1 ☐ (කොටුව තුළ අදාළ අංකය ලියන්න)
පුරුෂ - 2

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 අයැදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : රත්නපුර - 1 ☐ (කොටුව තුළ අදාළ අංකය ලියන්න)
කෑගල්ල - 2

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.
3.3 පදිංචිව සිටින කාලසීමාව :————.
3.4 ග්‍රාම නිලධාරි කොට්ඨාශය :————.

4.0 4.1 *උපන් දිනය :*

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.2 2011.06.13 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

5.0 *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

1. විභාගයේ වර්ෂය හා මාසය :————.
2. විභාග අංකය :————.
3. ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2

| *ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව/ සමත් වී ඇති මධ්‍ය පරීක්ෂණය හෝ මූලික පරීක්ෂණය/අවසාන සහතිකය කුමක් ද යන්න* | *එම සුදුසුකම් ලබාගත් විශ්ව විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ/ ආයතනයේ නම* | *එම සහතිකය වලංගු වන දිනය* |
|---|---|---|
| | | |

5.3

| *සේවය කළ ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ නම* | *දැරූ තනතුර* | *කාලය* | | *මෙම තනතුරට ගිණුම් හා කළමනාකරණ කටයුතුවල රාජකාරී ද ඇතුළත්ව තිබුනේ ද යන්න* |
|---|---|---|---|---|
| | | *සිට* | *දක්වා* | |
| | | | | |

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
(ii) ලදුපතේ අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.0 *අයදුම්කරුගේ සහතිකය.-*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) ම විසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

9.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය :—————.

—————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය ද ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිළධාරියකු විසින් සම්පූර්ණ කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ .................................................. දින සිට ................................................ තනතුරේ සේවය කරන ................................................................................................................ මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හෝ
බලය පවරනු ලබන නිළධාරියාගේ අත්සන.

නම :—————.
පදවිය :—————.
දිනය :—————.
දෙපාර්තමේන්තුව/ආයතනය :—————.

05-238

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.